www.xtrapapers.com

UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2013**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.

At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

DC (KN/KN) 67166/1
© UCLES 2013

UNIVERSITY *of* CAMBRIDGE International Examinations

[Turn over

www.xtrapapers.com



BLANK PAGE

www.xtrapapers.com



## Section A – Translation

**1** Translate into **English**.

එය ළදරු පාසලේ ක්‍රීඩා දිනයයි. ක්‍රීඩා පාවහන් සමග කොට කලිසම් හා ටී ෂර්ට් එදින අඳින ලෙස සියලුම ළමයින්ට කියන ලදී. ගුරුවරියෝ දෙදෙනෙක් පලතුරු යුෂ බීම අලෙවි සැලක් සූදානම් කරමින් සිටියහ. දෙමාපියෝ දෙපස සිටගෙන දරුවන් දෙසට අත් වනමින් සිටියහ. ළමයින් සන්සුන්ව තබා ගැනීම ගුරුවරුන්ට ඉතා අපහසු වීය.

ධාවන තරඟ පහක් සංවිධානය කර තිබිණ: හැන්ද මත බිත්තරයක් තබා ගෙන දිවීම, බාධක දිවීම, ගෝනිවල බැස දිවීම, පැන පැන දිවීමේ තරඟය හා දෙමාපියන්ගේ හා දරුවන්ගේ තරඟය. සෑම තරඟයක ම ජයග්‍රාහකයාට පදක්කමක් ද දෙවැනියාට සැනසිලි ත්‍යාගයක් ද දෙන ලදී.

සියලු තරඟකරුවෝ පලතුරු යුෂ බීමට ගියහ. දෙමාපියෝ අත්පොළසන් දෙමින් සියලු තරඟ කරුවන් දිරිමත් කළහ. ඔවුහු පසුව අවසන් තරඟයට සහභාගි වූහ. දෙමාපියෝ හා දරුවෝ ගුරුවරුන්ට ස්තුති කිරීම සඳහා ප්‍රීති ඝෝෂා කළහ. ඉන් පසු දෙමාපියෝ තම තමන්ගේ දරුවන් සොයා ගෙන ඔවුන් සමඟ ගෙදර ගියහ.

[10]

**2** Translate into **Sinhala**.

Three horses lived in a stable next to the farm house. The farmer's son and daughter would often take them for a ride out in the fields and down the village streets.

One morning, the sun was shining and the horses were outside in the field. The farmer noticed a fox trying to steal one of his chickens and fired his gun to scare the fox away. The horses were frightened and ran across the field. One of the horses jumped over the fence and disappeared down the lane. The other two horses stopped at the fence.

The farmer's daughter and her brother picked up two saddles and a rope to catch the escaped horse. They mounted the two horses that were still in the field and followed.

Two young farm helpers indicated the direction that the first horse had gone. The girl and boy raced down the road. Then they saw the escaped horse eating grass in the next field. Slowing down, they prepared the rope and approached the horse quietly. Gently, they put it over the horse's head and led him back to the stable.

[20]

© UCLES 2013

www.xtrapapers.com



## Section B – Reading Comprehension

Do **not** translate the passage below. First read it carefully and then answer, briefly and in **Sinhala**, the questions that follow.

### ඔලිම්පික් ක්‍රීඩා

ඔලිම්පික් ක්‍රීඩා අවුරුදු 2500 ක් පමණ කාලයක් තිස්සේ පවත්වා ඇත. ඔලිම්පික් යන නම ලැබී ඇත්තේ පුරාණ කාලයේ දී ග්‍රීසියේ ඔලිම්පියා නම් වූ මිටියාවතක අවුරුදු හතරකට වරක් එම ක්‍රීඩා තරඟ පවත්වන ලද නිසාය. ආරම්භයේ දී සියස් (Zeus) නම් වූ ග්‍රීක දෙවියන්ට උපහාරයක් වශයෙන් එම ක්‍රීඩා පවත්වන ලද අතර ඒවා ආගමික උත්සවයක් ලෙස මාසයක් පුරා පැවැත්විණි. ග්‍රීසියේත් ග්‍රීක අධිරාජ්‍යයේත් බොහෝ ප්‍රදේශවලින් තරඟවලට සහභාගි වීම සඳහා ක්‍රීඩකයෝ පැමිණියහ. සෑම ආකාරයක ම මලල ක්‍රීඩා ඉසව් හා ග්‍රීක දෙවිවරුන් සඳහා බිලි පූජාවන් ද එහි දී පැවැත්විණි. පුරාණ කාලයේ දී ග්‍රීක පෞර රාජ්‍යයන් එකිනෙකා සමඟ නිරන්තරයෙන් සටන් වැදෙමින් සිටි නිසා ඔලිම්පික් නිම්නය අසළ වූ එලිස් නගරයේ සිට මාසයකට කලින් නිවේදකයෝ තරඟකරුවන්ට ආරක්ෂිතව ඔලිම්පියා වෙත ගමන් කළ හැකි බව සහතික කිරීම පිණිස සටන් විරාමයක් ප්‍රකාශ කළහ.

හෝමර් නම් සුප්‍රකට ග්‍රීක කවියා මේ ක්‍රීඩා ගැන ලියා ඇති අතර ක්‍රි. පූ. 776 දී ඔලිම්පික් ක්‍රීඩා පැවැත් වූ බව තම ලේඛනවල සඳහන් කර ඇත. ක්‍රීඩා තරඟවලින් ජය ලැබූවන්ට ක්‍රීඩාගාරයේ රැස් වූ විශාල පිරිසක් ඉදිරියේ කොළවලින් සෑදූ මල්දමක් පළඳවන ලදී. තම උපන් බිමට ආපසු පැමිණෙන ජයග්‍රාහකයින් උත්සවශ්‍රීයෙන් පිළිගන්නා ලද අතර ඔවුන්ට මුදල් හෝ ඔලිව් තෙල් වැනි ත්‍යාග ද පිරිනමන ලදී. ඔවුන් වීරයින් ලෙස සලකන ලද අතර ඔවුන්ගේ ප්‍රතිමා පවා ඉදිකරන ලදී.

ක්‍රි. ව. 394 පමණ වන තුරු ඔලිම්පික් ක්‍රීඩා තරඟ මේ ආකාරයෙන් පවත්වා ගෙන එන ලදී. එතැන් සිට ග්‍රීසිය රෝම අධිරාජයාගේ පාලනයට යටත් වූයෙන් ඔලිම්පික් ක්‍රීඩා ක්‍රිස්තියානි දෙවියන් වෙනුවෙන් නොව ග්‍රීක දෙවිවරුන්ට උපහාර වශයෙන් පවත්වන ලද හෙයින් ඒවා තහනම් කරන ලදී. වසර 1500 ක පමණ කාලයක් නතර වී තිබීමෙන් පසු පියේ ද කුබටැන් (Pierre de Coubertin) නම් ප්‍රංශ ජාතිකයා විසින් ඔලිම්පික් ක්‍රීඩා තරඟ වර්තමාන ස්වරූපයෙන් නව පණ ගන්වන ලදී. ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව පත්කරන ලද අතර ඔලිම්පික් ක්‍රීඩා තරඟ පෙර පරිදි අවුරුදු හතරකයට වරක් පැවැත්විය යුතු වුවත් ඒවා ග්‍රීසියේදී ම නොව වෙන වෙන රටවල පැවැත්විය යුතුයයි තීරණය විය. නූතන යුගයේ පළමුවන ඔලිම්පික් තරඟය 1896 දී ග්‍රීසියේ ඇතැන්ස් නුවර දී පැවැත්විණි. ඊළඟට පැරීසියේ පවත්වන ලද තරඟවලට ප්‍රථම වතාවට කාන්තාවෝ ද සහභාගි වූහ. නූතන ඔලිම්පික් තරඟවලට දේශපාලන බලපෑම් ද එල්ල වී ඇත. ලෝකයුද්ධ දෙක නිසා මෙම ක්‍රීඩා තරඟ බොහෝ කාලයක් නතර වී තිබිණ. 1936 දී බර්ලින් නගරයේ පැවැත් වූ ඔලිම්පික් තරඟවල දි ජර්මනියේ නට්සිවාදින් කල්පනා කළේ ජයග්‍රාහකයින්ට පිරි නමනු ලබන රන් පදක්කම් හතරක් ම කලු ඇමරිකානු ජෙස් ඔවන්ස් දිනා ගැනීම නිසා තම සුදුජාතික ආධිපත්‍යයට හිමිවිය යුතු සහයෝගයට හානි සිදුවිය හැකි බවයි.

පසුගිය වසර ගණනාවක කාලය තුළ ඔලිම්පික් තරඟවල ජනප්‍රියතාව ඉක්මණින් වැඩී ගියේය. 1896 පැවති පළමුවන ඔලිම්පික් තරඟයට රටවල් 14 ක ක්‍රීඩකයින් 241 ක් සහභාගි වුවත් 2008 ඔලිම්පික් තරඟ සඳහා රටවල් 204 ක ක්‍රීඩකයෝ 10500 ක් සහභාගි වූහ. ප්‍රධාන ක්‍රීඩා ඉසව් නැරඹීම සඳහා ඇදී එන ප්‍රේක්ෂක පිරිස නොකඩවා ම වැඩිවන අතර ඔලිම්පික් ලෝක වාර්තා බිඳ දමනු ලබන අයුරු ඔවුහු දැක බලා ගනිති. ග්‍රීෂ්ම සෘතු තරඟයක් ලෙස මුල දී පටන් ගත් නමුත් ශීත සෘතු ඔලිම්පික්,

www.xtrapapers.com



ආබාධිතයින්ගේ ඔලිම්පික් හා යෞවන ඔලිම්පික් වශයෙන් එය ව්‍යාප්ත වී ඇත. ඔලිම්පික් තරඟ අතිශයින් ජනප්‍රිය වී තිබීමත් ඒවායේ ගෝලීය බලපෑමත් නිසා බොහෝ බහුජාතික සමාගම් එහි දී තම ප්‍රචාරක කටයුතු කර ගැනීමට මහත් උනන්දුවක් දක්වයි. දැන් මේ තරඟවලට ආධුනික ක්‍රීඩකයින් පමණක් නොව වෘත්තීය ක්‍රීඩකයෝ ද සහභාගි වෙති. ගෝලීය රූපවාහිනී හා වෙළඳ ප්‍රචාරය යන්නෙන් අදහස් වන්නේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අති විශාල වශයෙන් මුදල් උපයා ගන්නට අවස්ථාව උදා වී තිබෙන බවය.

Now answer the following questions briefly, using your own words as far as possible.

**3** ඔලිම්පික් ක්‍රීඩා යන නම ලැබුණේ කොහෙන් ද? [1]

**4** පැරණි ග්‍රීසිය තුළ එහි මෙහි ගමන් කිරීම ආරක්ෂා සහිත නොවූ බවට මේ ලිපියේ සඳහන් සාක්ෂි මොනවා ද? [2]

**5** පුරාණ කාලයේ දි ක්‍රීඩා තරඟ පැවති බවට අපට ඇති සාක්ෂි මොනවා ද? [1]

**6** පැරණි කාලයේ දි ජයග්‍රාහකයින්ට තෑගි දෙන ලද්දේ කෙසේ ද? (කරුණු තුනක් දක්වන්න) [3]

**7** ක්‍රි. ව. 394 දී පමණ ක්‍රීඩා නැවැත්වූයේ කවු ද? [1]

**8** ක්‍රීඩා පුනර්ජීවනයට පත් කළේ කවු ද? ඔහුගේ ප්‍රතිපත්ති මොනවා ද? [4]

**9** නූතන කාලයේ ප්‍රථම ඔලිම්පික් ක්‍රීඩා තරඟ ග්‍රීසියේ ඇතැන්ස් නුවර පවත්වන ලද්දේ කුමක් නිසාදැයි ඔබ සිතන්නෙහි ද? [2]

**10** නූතන ඔලිම්පික්වලට එල්ල වූ දේශපාලන බලපෑම් මොනවා ද? [2]

**11** ඔලිම්පික් ක්‍රීඩා සාර්ථක බවට දැක්විය හැකි සාධක කවරේ ද? [4]

Language and Spelling [5]

**Total [25]**

www.xtrapapers.com



BLANK PAGE

www.xtrapapers.com



BLANK PAGE

www.xtrapapers.com



**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.

© UCLES 2013